# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2022/33 - 2017 ජුනි මස 09 වැනි සිකුරාදා - 2017.06.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

### මධ්‍යම පළාතේ පළාත් සභාව

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවරිය විසින් කරනු ලබන පත්කිරීම්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154(ඊ) 5 වැනි වගන්තිය යටතේ මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවර ඊ. එම්. නිලූකා සඳරුවනී ඒකනායක වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පහත සඳහන් පත්කිරීම් 2017.05.02 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදුකරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**ගරු තෙන්නකෝන් මුදියන්සේලාගේ තිළිණ බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමා**

මධ්‍යම පළාත් සභාවේ ක්‍රීඩා, යෞවන කටයුතු, වනිතා කටයුතු, ග්‍රාමීය සංවර්ධන සහ කර්මාන්ත අමාත්‍යවරයා.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවවස්ථාවේ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154 (ඊ) 5 වගන්තිය යටතේ මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවර ඊ. එම්. නිලූකා සඳරුවනී ඒකනායක වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පහත සඳහන් පත්කිරීම් 2017.05.03 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදුකරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ. (මධ්‍යම පළාත් අමාත්‍යාංශ විෂයයන් සංශෝධනය කිරීමට අදාළ 2017.05.03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව)

**ගරු සරත් ඒකනායක මැතිතුමා**

මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍යාංශය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, සංචාරක, ඉඩම්, සමුපකාර සංවර්ධන, වෙළඳ හා වාණිජ, ආහාර සැපයුම් හා බෙදාහැරීමේ කටයුතු, පරිසර කටයුතු සහ ආයෝජන සම්බන්ධීකරණ, වෙනත් අමාත්‍යාංශයක් යටතට නොගැනෙන විෂයයන් භාර අමාත්‍යවරයා.

**ගරු එම්. රාමේෂ්වරන් මැතිතුමා**

මධ්‍යම පළාත් කෘෂිකර්ම, සුළු වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, ගොවිජන සංවර්ධන, මිරිදිය ධීවර, හින්දු සංස්කෘතික, ද්‍රවිඩ අධ්‍යාපන (මුස්ලිම් පාසල් හැර) සහ වතු යටිතල පහසුකම් අමාත්‍යවරයා.

ඊ. එම්. නිලූකා සඳරුවනී ඒකනායක,
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර.

06 - 881

1A - PG 3558 — 17 (2017/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*